සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ගිණුම්කරණය - I

13 ශ්‍රේණිය **කාලය පැය 02 යි.**

උපදෙස්:-

- ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරේ අංකය තෝරා තිත් ඉරි මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට අදාළ කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.

---

01. මූල්‍ය වාර්ථාකරණයේ සංකල්පනාත්මක රාමුව අනුව, බලපවත්නා උපකල්පනය හා මූලික ගුණාත්මක ලක්‍ෂණ පිළිවෙලින්,

(1) උපචිත පදනම, අදාළභාවය, විශ්වාසනීය නියෝජනය.

(2) අදාළ භාවය, විශ්වාසනීය නියෝජනය, අඛණ්ඩ පැවැත්ම.

(3) ආරක්‍ෂණය, අවබෝධ කරගත හැකි බව, විශ්වාසනීය නියෝජනය.

(4) අඛණ්ඩ පැවැත්ම, අදාළභාවය, විශ්වාසනීය නියෝජනය.

(5) උපචිත පදනම, සැසඳිය හැකිබව, කාලීන බව. (......)

02. ලයාන් විසින් 2014/04/01 දින රු. 500,000 ක් ප්‍රාග්ධනය ලෙස යොදවා නව ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2015/03/31 දිනට ව්‍යාපාරයේ වගකීම් රු. 200,000 ක් පැවතුණි. 2015/03/31 දිනෙන් අවසන් වර්ෂය තුළ රංගන තම පෞද්ගලික මුදලින් රු. 80,000 ක් ව්‍යාපාරයේ ණයහිමියන් පියවීමට භාවිතා කර ඇත. 2015/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ලාභය රු. 180,000 ක් වූ අතර රු. 100,000 ක මුදලක් ලයාන් පෞද්ගලි ප්‍රයෝජනයට රැගෙන ගොස් ඇත. 2015/03/31 දිනට ව්‍යාපාරයේ පැවැති වත්කම් කොපමණ ද?

(1) රු. 800,000 (2) රු. 860,000 (3) රු. 900,000 (4) රු. 950,000 (5) රු. 960,000 (......)

03. පහත සඳහන් ගණුදෙනු අතරින් පොදු ජ'නලයේ වාර්තා නොකරන ගණුදෙනු වර්ගය වන්නේ,

(1) වැරදි නිවැරදි කිරීමේ සටහන්

(2) ගැලපුම් සටහන්

(3) ආරම්භක සටහන්

(4) ස්ථාවර වත්කම් හුවමාරු කිරීම්

(5) දේපළ, පිරියත හා උපකරණ අත්පිට මුදලට මිලදී ගැනීම (......)

04. කිසියම් වත්කමක නීතිමය අයිතිය ව්‍යාපාරය සතුව පැවතුණත්, එමගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබේ නම් එය වත්කමක් ලෙස හඳුනානොගත යුතු බවට මඟ පෙන්වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) ව්‍යාපාර ඒකක සංකල්පය

(2) උපලබ්ධි සංකල්පය

(3) යථාරූපි (හරාත්මක බවේ) සංකල්පය

(4) උපචිත සංකල්පය

(5) ගැලපුම් සංකල්පය (......)

05. සීමිත බිලාන් පොදු සමාගම රු. මිලියන 25 ක් වැයකොට නව යන්ත්‍රයක් ජපානයෙන් ගෙන්වා ව්‍යාපාරය තුළ සවි කරන ලදී. මෙහි වෙළඳපොල වටිනාකම රු. මිලියන 35 ක් වුවත් සමාගමේ පොත්වල මෙම වත්කම නිරූපණය කොට ඇත්තේ රු. මිලියන 25 ක් ලෙසටය. මේ සඳහා පදනම් වන ගිණුම්කරණ සංකල්පය,

(1) ආරක්ෂණ (2) ව්‍යාපාර ඒකක (3) අඛණ්ඩ පැවැත්ම
(4) උපචිත (5) ඓතිහාසික පිරිවැය (......)

06. ''පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන'' සම්බන්ධ නිවැරදි ප්‍රකාශනය වන්නේ,

(1) කළමනාකරුවන්ගේ තීරණ ගැනීමේ අවශ්‍යතා වෙනුවෙන් පිළියෙල කරයි.

(2) පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, සංකල්ප ආදියට පටහැනිව පිළියෙළ කරනු ලබයි.

(3) අයිතිකරුවන්ගේ අවශ්‍යතාවය මත පිළියෙළ කරනු ලබයි.

(4) ගිණුම්කරණ තොරතුරු තමන්ටම ලබාගත නොහැකි පාර්ශවයන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීමට පිළියෙල කරනු ලබයි.

(5) සමාජයේ පොදු යහපත උදෙසා සුභසාධන පරමාර්ථයෙන් පිළියෙළ කරයි. (......)

07. 2015/03/31 දිනට සීමිත බඹරවැලි සමාගමේ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර, එම වෙනස අවිනිශ්චිත ගිණුමට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ශනයක දී පහත දෑ හෙළිදරව් විය.

- බොල්ණය කපාහැරීම් රු. 40,000 ක් ආදායමක් ලෙස සටහන් කර තිබුණි.
- ණයහිමියෙකුට ගෙවන ලද රු. 50,000 ක් ණයගැති පාලන ගිණුමේ මුදල් ලැබීම් ලෙස සටහන් කර තිබුණි.
- වැටුප් සඳහා ගෙවූ රු. 200,000 ක් මුදල් පොතේ පමණක් සටහන් කර තිබුණි.
- විකුණුම් ජ'නලය රු. 60,000 ක් අඩුවෙන් එකතු කර තිබුණි.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය,

(1) රු. 290,000 ක් හර (2) රු. 290,000 ක් බැර
(3) රු. 380,000 ක් හර (4) රු. 380,000 බැර
(5) රු. 440,000 බැර (......)

(08) 2015/03/31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 180,000 ක් වූ අතර, එය එදිනට පිළියෙළ කළ ණයගැති ශේෂ ලේඛනයේ එකතුව හා සමාන නොවීය. එම වෙනට හේතු පහත දක්වා ඇත.

- විකුණුම් ජ'නලයේ එකතුව රු. 60,000 ක් අඩුවෙන් ණයගැති පාලන ගිණුමේ සටහන් කර ඇත.
- බොල් ණය ලෙස කපාහල ණයගැතියෙකුගෙන් ලද රු. 5,000 ක මුදල ණයගැති පාලන ගිණුමට හර කර ඇත.
- රු. 10,000 ක බැර ණයගැති ශේයක් ශේෂ ලේඛනය පිළියෙළ කිරීමේ දී මඟහැරී ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ණයගැති ශේෂ ලේඛණයේ එකතුව වන්නේ,

(1) රු. 180,000 කි. (2) රු. 235,000 කි. (3) රු. 240,000 කි.
(4) රු. 245,000 කි. (5) රු. 250,000 කි. (......)

- **ප්‍රශ්න අංක 09 හා 10 ට පිළිතුරු සැපයීමට ආයතනයකට අදාළව පහත සඳහන් තොරතුරු භාවිතා කරන්න.**

  - 2015 මැයි සහ අප්‍රේල් මාස තුළ දී තැන්පත් කළ චෙක්පත් හා නිකුත් කළ චෙක්පත්වල සාරාංශය පහත පරිදි වේ.

විස්තරය	2015 මැයි (රු. ,000)	2015 අප්‍රේල් (රු. ,000)
චෙක්පත් තැන්පත් කිරීම්	2,000	1,800
චෙක්පත් නිකුත් කිරීම්	1,500	1,200

පහත තොරතුරු ද දී ඇත.

විස්තරය	2015/05/31 දිනට (රු. ,000)	2015/04/30 දිනට (රු. ,000)
චෙක් තැන්පතු උපලබ්ධි වීම	1,500	1,800
ගෙවීම සඳහා ඉදිරිපත් කළ චෙක්පත්	1,300	1,000
බැංකුවට සෘජු ව ලද පොළී ආදායම		100
බැංකු ගාස්තු	20	10
බැංකු ගිණුමේ ශේෂය (පොලී ආදායම හා බැංකු ගාස්තු ගැලපීමට පෙර)	790	200
බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය	?	490

අප්‍රේල් මාසය තුළදී ඉදිරිපත් නොකළ චෙක්පත් මැයි මාසයේ දී ගෙවීමට ඉදිරිපත් කර ඇත.

(09) 2015/04/30 දිනට බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය කොපමණ ද?

(1) රු. 380,000 (2) රු. 290,000 (3) රු. 400,000 (4) රු. 580,000 (5) රු. 690,000 (......)

(10) 2015/05/31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය කොපමණ ද?

(1) රු. 490,000 (2) රු. 670,000 (3) රු. 590,000 (4) රු. 770,000 (5) රු. 790,000 (......)

- **ප්‍රශ්න අංක 11 හා 12 ට පිළිතුරු සැපයීම සඳහා ආයතනයක තොග අයිතමයන්ට අදාළ පහත තොරතුරු භාවිතා කරන්න.**

දිනය	විස්තරය	ඒකක ගණන	ඒකක පිරිවැය (රු.)
2015/03/07	ශේෂය	3,000	10
2015/03/10	ගැණුම්	4,000	15
2015/03/28	ගැණුම්	4,000	05

(11) තොග නිකුත් කිරීම සඳහා බරතැබූ සාමාන්‍ය මිල ක්‍රමය භාවිතා කළේ නම් 2015/03/28 දිනෙන් අවසන් වර්ෂයේ විකුණුම් පිරිවැය කොපමණ ද?

(1) රු. 100,000 කි. (2) රු. 110,000 කි. (3) රු. 115,000 කි.
(4) රු. 120,000 කි. (5) රු. 125,000 කි. (......)

(12) තොග නිකුත් කිරීම සඳහා ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු ක්‍රමය (FIFO) ක්‍රමය භාවිතා කළේ නම් 2015/03/28 දිනෙන් අවසන් වර්ෂයේ විකුණුම් පිරිවැය කොපමණ ද?

(1) රු. 80,000 (2) රු. 100,000 (3) රු. 105,000 (4) රු. 115,000 (5) රු. 120,000 (......)

(13) ව්‍යාපාරයක ලාභය කෙටුම්පත් කිරීමෙන් පසුව, ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ පහත වැරදි සිදුව ඇති බව අනාවරණය කර ගන්නා ලදී.

A. ණයට විකුණුම් රු. 20,000 ක් පොත්වලින් සම්පූර්ණයෙන් ම මගහැරී ඇත.

B. රු. 60,000 ක් වූ අවසන් තොගය වාර්තා කර නොමැත.

C. රු. 25,000 ක් වූ ආරම්භක බැංකු අයිරාව බැංකු ගිණුමේ හර පැත්තේ සටහන් කර ඇත.

D. ණයහිමි ගිණුම එකතු කිරීමේ දී හර පැත්ත රු. 2,000 ක් අඩුවෙන් එකතු කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීම මඟින් ව්‍යාපාරයේ ලාභයට කුමක් සිදුවේද?

(1) රු. 20,000 කින් අඩුවේ. (2) රු. 80,000 කින් අඩුවේ.
(3) රු. 20,000 කින් වැඩිවේ. (4) රු. 80,000 කින් වැඩිවේ.
(5) රු. 105,000 කින් වැඩිවේ. (......)

(14) ආයතනයක් 2008/04/01 දින රු. 420,000 ක් වැය කර නව යන්ත්‍රයක් අත්පත් කරගත් අතර එහි ඵලදායී ජීවකාලය වසර 10 ක් හා සුන්බුන් වටිනාකම රු. 20,000 ක් විය. 2014/04/01 දින රු. 100,000 ක වියදමක් දරා මෙම යන්ත්‍රය නවීකරණය කළ අතර එමගින් එහි ඵලදායී ජීවකාලය වසර 04 කින් වැඩි විය. ආයතනය විසින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

2015/03/31 න් අවසන් වර්ෂය සඳහා මෙම යන්ත්‍රයේ ක්ෂය වියදම වන්නේ,

(1) රු. 25,000 කි. (2) රු. 30,000 කි. (3) රු. 32,500 කි.
(4) රු. 40,000 කි. (5) රු. 42,500 කි. (......)

(15) මල්ෂාන් ව්‍යාපාරයේ ආරම්භක වත්කම්වලට වඩා අවසාන වත්කම් රු. 200,000 කින් ඉහළ ගොස් ඇති අතර ආරම්භක වගකීම්වලට වඩා අවසාන වගකීම් රු. 50,000 කින් පහළ ගොස් ඇත. වර්ෂය තුළ අයිතිකරුවා රු. 100,000 ක අමතර ප්‍රාග්ධනයක් යොදවා ඇති අතර රු. 20,000 ක ගැනිලි සිදුකර ඇත. වර්ෂයේ ශුද්ධ ලාභය හෝ අලාභය වන්නේ,

(1) අලාභය රු. 30,000 කි. (2) අලාභය රු. 100,000 කි.
(3) ලාභය රු. 150,000 කි. (4) ලාභය රු. 170,000 කි.
(5) ලාභය රු. 250,000 කි. (......)

(16) තාරක, චාරුක හා චරිත සමසමව ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක නියුතුව සිටි අතර 2014/04/01 දින චරිත හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. චරිත විශ්‍රාම ගැනීමේදී හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 600,000 කට අගය කළ අතර එය හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම තුළින් ගැලපීමට එකඟ විය. එමෙන්ම චරිත විශ්‍රාම ගැනීමේ දී ඔහුට ගෙවිය යුතු හිමිකම නිරවුල් නොකොට ව්‍යාපාරයේ ණයක් ලෙස රඳවා ගැනීමට එකඟ විය. චරිත විශ්‍රාම ගැනීමෙන් පසු තාරක හා චාරුක 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගැනීමට එකඟ වන ලදී. 2015/03/31 දිනට පහත ශේෂ පැවතුණි.

	රු. ,000
ප්‍රාග්ධන ගිණුම චරිත (කීර්තිනාමය ගැලපීමට පෙර)	600
ජංගම ගිණුම චරිත	(300)

2015/03/31 න් අවසන් වර්ෂය සඳහා චරිතට ගෙවිය යුතු ණය පොළිය කීයද?

(1) රු. 20,000 කි. (2) රු. 25,000 කි. (3) රු. 30,000 කි.
(4) රු. 35,000 කි. (5) රු. 50,000 කි. (......)

(17) හවුල් ව්‍යාපාරයක අත්‍යවශ්‍ය ගුණාංගයක් නොවන්නේ,

(1) ව්‍යාපාරික ස්වරූපයේ කටයුත්තක නිරත වීම.

(2) සාමූහිකත්වය මත තීරණ ගැනීම.

(3) අවම සාමාජිකයන් 02 ක් හා උපරිමය 20 කට සීමා වීම.

(4) ලාභ ලැබීමේ පරමාර්ථය.

(5) ලාභාලාභ සමසමව බෙදා ගැනීම. (......)

(18) නිලාවැලි සමාගමේ ගිණුම් වර්ෂය 2015 මාර්තු 31 දිනෙන් අවසන් වේ. අධ්‍යක්ෂවරු 2015/08/10 දින මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඇත. වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසු සිද්ධීන් (LKAS - 10) අනුව 2015/03/31 දින මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නොගැලපෙන සිද්ධිය / සිද්ධි වන්නේ,

A. 2014/15 ගිණුම් වර්ෂය වෙනුවෙන් ස්කන්ධ සාධන පත්‍ර හිමියන් සඳහා 2015/05/11 දින ලාභාංශ යෝජනා කර ඇත.

B. 2015/06/30 දින කර්මාන්ත ශාලාව ගිනිගැනීමෙන් වූ අලාභය රු. 750,000 කි.

C. 2015/03/31 දින ආයෝජනවල පිරිවැය රු. 350,000 ක් වූ අතර ව්‍යාපාරයේ මූල්‍ය වාර්ථා සඳහා අධ්‍යක්ෂවරුන් අනුමැතිය ලබාදුන් 2015/08/10 දින ඇගයීමට අනුව ව්‍යාපාරය සතු ආයෝජනවල වෙළඳපොළ අගය රු. 275,000 ක් බව තහවුරු විය.

D. සමාගමක සේවකයෙකු විසින් සමාගමට එරෙහිව පවරන ලද නඩුවක් වෙනුවෙන් 2015/07/15 දින දෙන ලද නඩු තීන්දුවකට අනුව රු. 100,000 ක වන්දි මුදලක් ගෙවීමට නියම කර ඇත.

(1) A, D (2) A, B, C, D (3) A, B, C (4) C, D (5) C පමණි. (......)

(19) ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි (LKAS - 08) අනුව වැරදි ප්‍රකාශ වන්නේ,

A. ආයතනයක් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී භාවිතා කරන නිශ්චිත මූලධර්ම, පදනම්, සම්ප්‍රදායන්, රීතීන් සහ පරිචයන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ය.

B. වත්කම්, වගකීම් ආශ්‍රිත අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ සහ බැඳීම්, වර්තමානයේ දී පවතින තත්ත්වය අනුව තක්සේරු කිරීමේදී වත්කමක හෝ වගකීමක ධාරණ අගය සඳහා අවශ්‍යවන ගැළපීමක් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීමක් සේ හඳුනාගත හැකිය.

C. නව තොරතුරු හෝ නව ප්‍රවනතා හේතුවෙන් ගිණුම්කරණ ඇස්තමේන්තු වරින් වර වෙනස් වන අතර එය වැරදි නිවැරදි කිරීමක් ලෙස නොසැලකේ.

D. අතීතානුයෝගී ව්‍යවහාරය යනු ගණුදෙනු හා සිද්ධීන් සහ තත්ත්වයන්ට අදාළ නව ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර කාලච්ඡේදවලදී ත් අනුගමනය කළා සේ භාවිතා නොකිරීමයි.

(1) A, C, D (2) A, B, C, D (3) A, C (4) C, D (5) D පමණි. (......)

(20) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS - 01) ප්‍රමිතිය ඍජුව අදාළ වන්නේ,

(1) විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන.

(2) පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන.

(3) පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන හා විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන දෙවර්ගයටම.

(4) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී.

(5) මූල්‍යතත්ව ප්‍රකාශය පිළියෙල කිරීමේ දී. (......)

(21) රන්කැට සමාගමේ 2015/03/31 දිනට මෝටර් රථ වටිනාකම රු. 950,000 කි. එදිනට ක්‍ෂය වෙන්කිරීම් රු. 325,000 කි. 2015/03/31 දින කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනයට අනුව මෝටර් රථ වටිනාකම රු. 875,000 කි. මෙම වාහන 2013/03/31 දින කරන ලද ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස රු. 175,000 ක අලාභයක් එම වර්ෂයේ දී රඳවාගත් ලාභයට හර කර ඇත. 2015/03/31 දිනෙන් අවසන් වර්ෂයේ පිළියෙල කරන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම් වල හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ප්‍රත්‍යාගණන සංචිත තීරුවට ඇතුළත් කළ නිවැරදි අගය වන්නේ,

	වෙනත් විස්තීර්ණ ආදායම් වලට ගන්නා අගය	ප්‍රත්‍යාගණන සංචිත වල ඇතුලත් අගය
(1)	250,000	250,000
(2)	175,000	175,000
(3)	250,000	75,000
(4)	75,000	75,000
(5)	375,000	250,000

(......)

(22) ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියේ (LKAS - 37) සඳහන් නිර්වචනයන් පහත දැක්වේ. මින් වැරදි නිර්වචනය වන්නේ,

(1) ප්‍රතිපාදනයක් යනු කාලය හෝ ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිතතාවයක් සහිත වගකීමකි.

(2) වගකීමක් හෙවත් බැරකමක් යනු අතීත සිදුවීමක ප්‍රතිඵලයක් සේ වර්තමානයේ පවතින බැඳීමක් වන අතර එය නිරාකරණය කිරීමේ දී ආර්ථික ප්‍රතිලාභ ජනනය කළ හැකි ව්‍යාපාරයේ සම්පත් පිටතට ගලා යෑමක් සිදුවේ.

(3) බැඳීම් සහගත සිදුවීමක් යනු, නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇතිකරන සිදුවීමක් වන අතර, එහි ප්‍රතිඵලයක් සේ පියවීම සඳහා බැඳීමක් ඇතිවේ.

(4) නෛතික බැඳීමක් යනු ගිවිසුමක්, ව්‍යවස්ථාවක් හෝ අනෙකුත් නීතියක් ක්‍රියාත්මකවීම මගින් ඇතිවන බැඳීමකි.

(5) සම්මුතික බැඳීමක් යනු අතීත සිදුවීමක ප්‍රතිඵලයක් මත ඇතිවිය හැකි ආයතනයේ සම්පූර්ණ පාලනයෙන් තොර අනාගත අවිනිශ්චිත සිදුවීම් එකක් හෝ වැඩිගණනක් සිදුවීම හෝ නොවීම මත තහවුරු කරන බැඳීමකි.

(......)

(23) පහත සඳහන් කුමන දෑ සමාගමක හිමිකමේ සංරචක ලෙස හඳුනාගනු ලබයි ද?

A. රඳවාගත් ඉපැයුම්

B. ප්‍රත්‍යාගණන සංචිත

C. ගෙවිය යුතු අර්ථසාධක අරමුදල්

D. පොදු සංචිත

E. ක්ෂය වෙන්කිරීම්

(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) A, B හා D පමණි.

(4) C හා E පමණි. (5) A, B, C, D හා E පමණි. (......)

(24) 2015/03/31 න් අවසන් වර්ෂයේ ලකී සමාගමේ පහත තොරතුරු දී ඇත.

	රු. මිලියන
විකුණුම්	1,800
2014/04/01 තොගය	250
2015/03/31 තොගය	350
විකුණුම් පිරිවැය	1,200

වර්ෂය සඳහා වැඩකරන දින 360 ක් බව උපකල්පනය කරන්න.

2015/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ තොග රැඳවුම් කාලය,

(1) දින 60 (2) දින 72 (3) දින 75 (4) දින 90 (5) දින 105 (......)

(25) පහත තොරතුරු රන්දිව සමාගමේ වර්ෂයක් තුළ දී නිෂ්පාදනය සඳහා භාවිතාකළ රසායනික ද්‍රව්‍යයකට අදාළ වේ.

	උපරිම	අවම
පාරිභෝජනය (ඒකක)	5,000	4,000
පොරොත්තු කාලය (මාස)	12	06
උපරිම තොග මට්ටම ඒකක 76,000 කි.		

මෙම අමුද්‍රව්‍යයේ යළි ඇණවුම් මට්ටම හා යළි ඇණවුම් ප්‍රමාණය

	යළි ඇණවුම් මට්ටම (ඒකක)	යළි ඇණවුම් ප්‍රමාණය (ඒකක)
(1)	35,000	65,000
(2)	40,000	60,000
(3)	40,000	79,000
(4)	60,000	40,000
(5)	60,000	59,000

(......)

(26) පහත කාර්යයන් පොදුකාර්ය පිරිවැය භාණ්ඩ හා සේවා ඒකක කරා ගෙනයාමේදී නිවැරදි අනුපිළිවෙල කුමක් ද?

A. පොදුකාර්ය පිරිවැය විභාජනය කිරීම.

B. පොදුකාර්ය වෙන්කිරීම.

C. පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාත ඔස්සේ භාණ්ඩ හා සේවාකර අන්තර්ග්‍රහණය කිරීම

D. පොදුකාර්ය පිරිවැය රැස්කිරීම.

E. පොදුකාර්ය යළි විභාජනය

(1) A, E, B, C, D (2) D, B, A, C, E (3) D, B, A, E, C

(4) C, D, E, A, B (5) B, C, D, A, E (......)

(27) SF නිෂ්පාදකයා සඳහා 2015 ජනවාරි හා පෙබරවාරි මාස සඳහා පහත සඳහන් නිෂ්පාදන තොරතුරු ලැබී ඇත.

මාසය	ඒකක	මුළු පිරිවැය (රු)
ජනවාරි	24,000	250,000
පෙබරවාරි	30,000	310,000

ඉහත SF නිෂ්පාදකයා සඳහා පිළිවෙලින් මාසික ස්ථාවර පිරිවැය හා ඒකක විචල්‍ය පිරිවැය වන්නේ,

(1) රු. 10,000 හා රු. 10 (2) රු. 100,000 හා රු. 10 (3) රු. 10,000 හා රු. 100

(4) රු. 100,000 හා රු. 60 (5) රු. 100,000 හා රු. 12 (......)

(28) ''@'' ද්‍රව්‍ය පිළිබඳ පහත තොරතුරු සපයා ඇත.

මාසික පරිභෝජනය	ඒකක 750
ඒකක පිරිවැය	රු. 20
තොග තබා ගැනීමේ පිරිවැය ඒකක පිරිවැයෙන් 5%	
ඇණවුමක පිරිවැය	රු. 500

ආර්ථික ඇණවුම් ප්‍රමාණය වන්නේ.

(1) ඒකක 3,000 (2) ඒකක 4,000 (3) ඒකක 3,500 (4) ඒකක 2,500 (5) ඒකක 3,200 (......)

(29) සී/ස මල්ෂා සමාගම පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරන්නේ නිමැවුම් ඒකක ගණන පදනම් කරගෙනයි. පහත විස්තර දී ඇත.

	අයවැයගත	සත්‍ය
පොදුකාර්ය පිරිවැය	රු. 350,000	රු. 400,000
නිමැවුම	ඒකක 70,000	ඒකක 60,000
ශ්‍රම පැය	30,000	25,000

නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) පොදු කාර්ය රු. 50,000 ක් අඩුවෙන් අන්තර්ග්‍රහණය වී ඇත.
(2) පොදු කාර්ය පිරිවැය රු. 50,000 ක් වැඩියෙන් අන්තර්ග්‍රහණය වී ඇත.
(3) පොදු කාර්ය පිරිවැය රු. 100,000 ක් අඩුවෙන් අන්තර්ග්‍රහණය වී ඇත.
(4) පොදු කාර්ය පිරිවැය රු. 100,000 ක් වැඩියෙන් අන්තර්ග්‍රහණය වී ඇත.
(5) පොදු කාර්ය පිරිවැය නිවැරදිව අන්තර්ග්‍රහණය වී ඇත. (......)

(30) ගිණුම් ප්‍රමිත කමිටුවට අයත්වන පුද්ගලයෙකු නොවන්නේ,

(1) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති.
(2) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක සභාව නම් කරන එම ආයතනයේ සාමාජිකයන් පස්දෙනෙක්.
(3) එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාව විසින් නම් කරන ලද එක් සාමාජිකයෙක්.
(4) සමාගම් රෙජිස්ටාර්ජෙනරාල්.
(5) දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්. (......)

- **ප්‍රශ්න අංක 31 සිට 50 තේ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරමත ලියන්න.**

(31) පහත එකිනෙක ගිණුම් කුමන ගිණුම්කරණ මූලිකාංගයට අයත් වන්නේ ද යන්න දක්වන්න.

A. ආදායම් බදු වෙන් කිරීම ....
B. ගැණුම් ....
C. ක්ෂය වෙන්කිරීම් ....
D. ගැනිලි ....

(32) පහත සඳහන් ක්ෂේත්‍රවලට අදාළව කළමනාකරණ ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස්කම් ලියා දක්වන්න.

	ක්ෂේත්‍රය	කළමනාකරණ ගිණුම්කරණය	මූල්‍ය ගිණුම්කරණය
(1)	අවධානය යොමුවන කාලය		
(2)	වාර්තා කිරීමේ වාර ගණන		
(3)	භාවිතාකරන පාර්ශවය		
(4)	පොදුවේ පිළිගත් මූලධර්ම		

(33) සාමාන්‍ය කොටස් හා වරණීය කොටස් අතර ප්‍රධාන වෙනස්කම් 02 ක් සඳහන් කරන්න.

....

....

....

....

(34) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක 2014/04/01 දිනට සමුච්චිත අරමුදල රු. 500,000 ක් විය. මෙහි සාමාජිකයන් 100 දෙනෙකු 2014/15 වර්ෂය තුළ සිටි අතර එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 200 ක් විය. 2014/15 වර්ෂය සඳහා සාමාජික මුදල් හැර රු. 60,000 ක ආදායමක් පැවති අතර 2014/15 වර්ෂය සඳහා සංවිධානයේ වියදම රු. 100,000 ක් විය. වර්ෂය තුළ සමුච්චිත අරමුදලට බලපාන ගනුදෙනුවක් සිදු නොවූයේ නම් 2015/03/31 දිනට සමුච්චිත අරමුදල කීයද?

....

(35) ගංවතුර හේතුවෙන් 2015/03/31 දිනට ආසිරි ව්‍යාපාරයේ පැවති තොගයෙන් කොටසක් විනාශ විය. එදිනට බේරාගත් තොගයේ පිරිවැය රු. 80,000 ක් විය. පහත තොරතුරු ආසිරි ව්‍යාපාරයේ 2015/03/31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ වේ.

2015/03/31 දිනට තොගය	රු.	180,000
ගැනුම්	රු.	900,000
විකුණුම් අත්පිට	රු.	500,000
විකුණුම් ණයට	රු.	700,000

ව්‍යාපාරය පිරිවැය මත 25% ක දළ ලාභ අනුපාතයක් රඳවාගනී. ගින්නෙන් විනාශ වූ තොගයේ පිරිවැය කීයද?

....

(36) මුදල් පොතට අනුව බැංකු ශේෂය හා බැංකු ප්‍රකාශනයට අනුව බැංකු ශේෂය එකිනෙකට අසමාන වීමට බලපාන පහත කරුණු නිසා මුදල් පොතට අනුව බැංකු ශේෂය, බැංකු ප්‍රකාශනයේ ශේෂයට සාපේක්ෂව අඩුවේ ද හෝ වැඩිවේද යන්න දක්වන්න.

	අඩුවේ / වැඩිවේ
A. ඉදිරිපත් නොවූ චෙක්පත්	
B. නිශ්කාශනය නොවූ චෙක්පත්	
C. මුදල් පොතේ වාර්තා නොවූ බැංකු ගාස්තු	
D. මුදල් පොතේ වාර්තා නොවූ ණයගැති සෘජු ප්‍රේෂණ	

(37) මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව අනුව ආදායම් යන්න නිර්වචනය කරන්න.

....

....

....

....

....

(38) ආයතනයක් විසින් මූල්‍ය කල්බදු ක්‍රමයට පහත කොන්දේසි මත යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී.

- කල්බදු කාලය වසර 05 යි.
- රු. 750,000 ක කල්බදු වාරිකයක් වසර අග ගෙවිය යුතුය.
- කල්බදු ගිවිසුමේ ගම්‍ය පොළී අනුපාතය 20% කි.
- අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය රු. 1,866,500 කි.

කල්බදු ගිවිසුම ආරම්භයේ දී කල්බදු ගැනුම්කරුගේ පොත්වල වගකීම හඳුනාගැනීම සඳහා ජ'නල් සටහන ලියන්න. (සංලක්‍ෂ්‍ය අවශ්‍ය නොවේ.)

....

....

....

(39) පහත සඳහන් ප්‍රකාශන සත්‍ය ද නැතිනම් අසත්‍ය ද යන්න දක්වන්න.

A. අවසන් තොගය හා විකුණුම් පිරිවැය අතර අනුලෝම සම්බන්ධයක් පවතී. ....

B. ආරම්භක තොගය හා දළ ලාභය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතී. ....

C. තොගයක පිරිවැය සැමවිටම ශුද්ධ උපලබ්ධි අගයට වඩා අඩු වේ. ....

D. තොගයක පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධි අගය වැඩි වූ විට පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය අතර වෙනස ලාභයක් ලෙස හඳුනාගත යුතුය. ....

(40) අමල්, නිමල් හා සිසිල් පිළිවෙලට 4:3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් පවත්වාගෙන ආ හවුල් ව්‍යාපාරයෙන් 2015/03/31 දින සිසිල් විශ්‍රාම ගනී.

විශ්‍රාම ගැනීමේ ගැලපීම් කිසිවක් කිරීමට පෙර 2014/04/01 දිනට සිසිල්ගේ ප්‍රාග්ධන ගිණුමේ බැර ශේෂය හා ජංගම ගිණුමේ හර ශේෂය පිළිවෙලින් රු. 300,000 හා 50,000 ක් විය.

විශ්‍රාම ගැනීමේ දී සිසිල් පවරාගත් ලී බඩු වල පිරිවැය සමුච්චිත ක්ෂය හා පවරාගත් වටිනාකම පිළිවෙලින් රු. 90,000, රු. 30,000 ක් හා රු. 40,000 ක් වේ.

ව්‍යාපාරය විසින් තවදුරටත් ගෙවිය යුතු සිසිල්ගේ හිමිකම කොපමණ ද?

....

(41) පහත ප්‍රස්ථාරයෙන් භාණ්ඩයක තොග චලනයක් පෙන්නුම් කරයි. A හා B යනු මොනවා ද?



A. ....

B. ....

(42) පහත ප්‍රස්තාරය මගින් සමාගමක පිරිවැය හා විකුණුම් ආදායම විදහා දක්වයි. ප්‍රස්තාරයෙහි A, B, C හා D යන එකිනෙක අක්ෂරය මගින් පිළිබිඹු වන්නේ මොනවා ද?



A. ....

B. ....

C. ....

D. ....

(43) 2011 මාර්තු 31 දිනට සමාගමක ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 1,200,000 ක් වූ අතර, කොටසක සාමාන්‍ය අගය රු. 10 ක් විය. 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සෑම කොටස් තුනකටම එකක් වන පරිදි කොටසකට රු. 10 ප්‍රතිෂ්ඨාවක් යටතේ සමාගමෙහි සංචිත ප්‍රාග්ධනිත කරන ලදී. පසුව සෑම කොටස් දෙකකටම එක බැගින් වන සේ කොටසක් රු. 9 බැගින් වූ හිමිකම් නිකුතුවක් නිකුත් කරන ලදී. ප්‍රසාද කොටස් සහ හිමිකම් කොටස් නිකුතුවෙන් පසු සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය කුමක් ද?

....

(44) පිළිගෙවුම් කාලයට (Payback) සාපේක්ෂව ශුද්ධ වර්තමාන අගයේ (NPV) වාසි දෙකක් සඳහන් කරන්න.

1. ....

2. ....

(45) පහත දී ඇති ප්‍රස්තාර ව්‍යාපාරයක සමාන මූලික ආයෝජන වටිනාකම්වලින් යුත් ව්‍යාපෘති හතරකට අදාළ වේ.





(අ) ආයෝජන මුදල ඉක්මනින් ආවරණය කර ගැනීම සමාගම අපේක්ෂා කරන්නේ නම් කුමන ව්‍යාපෘතිය තෝරා ගත යුතු ද?

....

(ආ) ව්‍යාපෘතියෙහි මුදල් ප්‍රවාහයන්ගේ කාලීන අගය සලාක බලන්නේ නම්, කුමන ව්‍යාපෘතිය / ව්‍යාපෘති මූල්‍යමය වශයෙන් ඵලදායී වේ ද?

....

The National e-learning Portal for The General Education

(46) ව්‍යාපාරයක් 2015/03/31 දිනට ලකුණු කළ මිල රු. 200,000 ක් වූ භාණ්ඩ 10% ක වට්ටමකට යටත්ව ණයට මිල දී ගන්නා ලදී. මසක් ඇතුළත පියවන වටිනාකම මත 10% ක මුදල් වට්ටමක් ලබාදෙන බව ණයහිමියා දැනුම් දී ඇත. 2015/03/31 වන විට මුදලින් රු. 90,000 ක් ගෙවා ඇත්නම් 2015/03/31 දිනට වගකීම කීයද?

....

(47) 2011/04/01 දින සමාගමක් විසින් රු. 600,000 ක පිරිවැයක් දරා නව යන්ත්‍රයක් අත්පත් කරගත් අතර එහි ඵලදායී ජීව කාලය වසර 10 ක් බව හා වාර්ෂික ක්ෂය රු. 50,000 ක් බවට එදින ඇස්තමේන්තු කරන ලදී. 2014/03/31 දින රු. 100,000 ක පිරිවැයක් දරා මෙම යන්ත්‍රයට නව උපකරණයක් සවි කළ අතර එමගින් යන්ත්‍රයේ මෙහෙයුම් පිරිවැය සැලකිය යුතු මට්ටමකින් පහළ යන ලදී. එමෙන්ම 2014/04/01 දින සිට මෙම යන්ත්‍රය තවදුරටත් වසර 05 ක් පමණක් භාවිතා කළ හැකි බවට ඇස්තමේන්තු කරන ලදී. නමුත් එහි අවශේෂ වටිනාකම එලෙසම පවතිනු ඇත.

2015/03/31 දිනට මෙම යන්ත්‍රයේ ධාරණ වටිනාකම වන්නේ ....

(48) හවුල්කරුවෙකු ලෙස හවුල් ව්‍යාපාරයට දායකත්වය ලබාදිය හැකි ප්‍රධාන ආකාර 03 ක් නම්කර එම දායකවීම් වලට ලැබෙන ප්‍රතිලාභ ඒ ඒ දායකවීම ඉදිරියෙන් ලියන්න.

....

....

....

(49) සීමිත රන්සර සමාගම සඳහා 2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් විස්තර ඔබට සපයා ඇත.

	රු.
අමුද්‍රව්‍ය තොගයේ අඩු වීම	75,000
අමුද්‍රව්‍ය මිලට ගැනීම	810,000
මිලට ගැනීම ආපසු යැවීම අමුද්‍රව්‍ය	40,000
ගෙන යෑමේ කුලිය	64,000
ගෙන ඒමේ කුලිය	37,500
සෘජු වේතන	371,500
නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	214,600
නොනිමි වැඩ වල වැඩි වීම	29,400
ලැබුණු වට්ටම්	16,000

නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

....

....

(50) කපිලගේ ව්‍යාපාරයේ පොදු කාර්යය පිරිවැය සම්බන්ධ පහත තොරතුරු උපුටා ගෙන ඇත.

	නිමවුම් 1	නිමවුම් 2
ඇස්තමේන්තුගත පොදුකාර්ය පිරිවැය	180,000	120,000
ඇස්තමේන්තුගත නිෂ්පාදන ඒකක ගණන	1,500	2,000
එක් නිෂ්පාදනයකට ඇස්තමේන්තුගත ශ්‍රම පැය	4	2
එක් නිෂ්පාදනයකට සත්‍ය ශ්‍රම පැය	5	1.5

පොදුකාර්ය පිරිවැය ශ්‍රම පැය මත අන්තර්ගණනය කරනු ලබයි.

එක් නිෂ්පාදනයකට අන්තර්ගණනය කළ යුතු පොදුකාර්ය පිරිවැය නිමැවුම් දෙපාර්තමේන්තු 1 සහ 2 සඳහා වෙන වෙනම ගණනය කරන්න.

....

....

(ලකුණු 50 × 2 = 100)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ගිණුම්කරණය - II

13 ශ්‍රේණිය | **කාලය පැය 03 යි.**

උපදෙස් :-

- පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06 කට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීමේදී අළුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

---

(01) සීමිත මැල්සිරිපුර සමාගම 2014 අප්‍රේල් 01 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශන අයිතමයන් පහත දැක්වේ.

	රු.		රු.
රු. 10 සාමාන්‍ය කොටස්	10,000	ඉඩම් පිරිවැයට	10,000
ප්‍රත්‍යාගණන සංචිතය	3,000	මෝටර් රථ පිරිවැයට	6,300
පොදු සංචිතය	1,300	වෙළඳ බඩු තොගය	1,500
රඳවාගත් ලාභය	400	වෙළඳ ණයගැතියෝ	1,000
සමුච්චිත ක්ෂය වෙන්කිරීම්		මුදල් හා බැංකුව	200
මෝටර් රථ	3,000		
වෙළඳ ණයහිමියෝ	1,000		
උපචිත ආදායම් බදු	300		
	19,000		19,000

මෙම ව්‍යාපාරයේ 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ.

	රු.	රු. ,000
විකුණුම්		20,000
විකුණුම් පිරිවැය		(12,000)
දළ ලාභය		8,000
වෙනත් ආදායම මෝටර් රථ විකුණුම් ලාභ		200
		8,200
බෙදාහැරීම් වියදම්	1,500	
පරිපාලන වියදම්	3,000	
අනෙකුත් වියදම්	400	
මූල්‍ය වියදම්	300	(5,200)
බදු පෙර ලාභය		3,000
වර්ෂයේ ආදායම් බදු		(900)
වර්ෂයේ ලාභය		2,100

2015 මාර්තු 31 දිනට පැවති ජංගම වත්කම් සහ ජංගම වගකීම් පහත පරිදි වේ.

ජංගම වත්කම්		ජංගම වගකීම්	රු. ,000
වෙළඳ බඩු තොග	2,500	වෙළඳ ණයහිමියෝ	3,000
වෙළඳ ලැබිය යුතු දෑ	3,500	ගෙවිය යුතු ආදායම් බදු	200
ඉදිරියට ගෙවූ රක්ෂණ	200	ගෙවිය යුතු ලාභාංශ බදු	80
මුදල් හා බැංකු	520		

අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අනුමැතිය මත වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරන ලද තීරණ පහත දැක්වේ.

01. 2014 අප්‍රේල් 01 දින තිබූ සාමාන්‍ය කොටස් 05 කට එක් කොටසක් බැගින් ප්‍රසාද කොටස් නිකුත් කරන ලදී.
02. රු. 15 සාමාන්‍ය කොටස් 300,000 ක් නිකුත් කරන ලදී.
03. ඉඩම් රු. 12,000,000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී.
04. 2015 මාර්තු 31 දින රු. 5,500,000 ක් පිරිවැය වූ මෝටර් රථයක් මිලදී ගන්නා ලදී.
05. 2013 අප්‍රේල් 01 දින රු. 800,000 කට මිලදී ගත් මෝටර් රථයක් 2014 සැප්තැම්බර් 30 දින විකුණන ලදී. එමගින් රු. 200,000 ක ලාභයක් උපයා ඇත. මෝටර් රථ පිරිවැය මත වසරකට 20% බැගින් ක්ෂය කරයි.
06. වර්ෂයේ ලාභයෙන් රු. 200,000 ක් පොදු සංචිතයට මාරු කරන ලදී.
07. ලාභාංශය බදු ලෙස 10% ක් රඳවා ගෙන වර්ෂය තුළදී ගෙවූ ශුද්ධ අතුරු ලාභාංශ ප්‍රමාණය රු. 720,000 කි.

ඉහත තීරණ සියල්ල නිවැරදිව ගිණුම්ගත වී ඇත.

01. අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ තීරණයන්ට අදාළ ජ'නල් සටහන් (මුදල් ද ඇතුළුව)
02. 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
03. 2015 මාර්තු 31 දිනට ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකෘතියකින් මූල්‍යතත්ව ප්‍රකාශය.
04. මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට අදාළ මුදල් ප්‍රවාහය ඍජු ක්‍රමයට දක්වමින් 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

(ලකුණු 20)

(02) (අ) යමරාජා හා හෙණරාජා ලාභාලාභ පිළිවෙලින් 3:2 අනුපාතයට බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් කරගෙන ගියෝය. 2014 ජනවාරි 01 දිනට හවුල්කරුවන්ගේ ගිණුම්වල ශේෂ පහත පරිදි වේ.

	ප්‍රාග්ධන ගිණුම රු.	ජංගම ගිණුම රු.
යමරාජා	400,000	8,000 (බැර)
හෙණරාජා	200,000	3,000 (බැර)

2014 ජනවාරි 01 දින හෙණරාජාගේ පුත් ධර්මරාජා නව හවුල්කරුවෙකු ලෙස බඳවා ගන්නා ලද අතර ඔහු රු. 150,000 ක් ප්‍රාග්ධනය ලෙස යොදවන ලදී. එදින කීර්තිනාමය රු. 300,000 කට තක්සේරු කරන ලදී. කීර්තිනාම ප්‍රාග්ධන ගිණුමෙන් ගැලපීමට තීරණය කරන ලදී.

නව හවුල් ගිවිසුමේ පහත කොන්දේසි ඇතුලත් වේ.

01. ලාභාලාභ 3:2:1 අනුපාතයට බෙදා ගැනීම.
02. හවුල්කරුවන්ගේ වේතන යමරාජා වසරකට රු. 100,000 ක් හා හෙණරාජා මසකට රු. 5,000 යි.
03. ප්‍රාග්ධන පොළී අනුපාතය 10% කි.

නුපුහුණු ලිපිකරු වූ ඔවුන්ගේ පොත් තබන්නා කෙටුම්පත් ගිණුම් සකස්කරන ලද අතර 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා රු. 158,000 ශුද්ධ ලාභයක් (විසර්ජනයට පෙර) පෙන්නුම් කරන ලදී. මූල්‍ය තත්ව ප්‍රකාශයේ අවිනිශ්චිත ගිණුමක් පෙන්නුම් කළ නිසා ගිණුම් නැවත පරීක්ෂා කළ අතර එහිදී පහත වැරදි සොයාගන්නා ලදී.

01. මුදල් පොතේ ලද වට්ටම් තීරුවේ එකතුව රු. 1,750 බොල්ණය ගිණුමට හර කර තිබේ.

02. යමරාජාට රු. 25,000 ක් හා හෙණරාජාට රු. 10,000 ක් වශයෙන් හවුල්කරුවන්ට ගෙවූ හවුල් වේතන, සේවක වේතන ගිණුමට පිටපත් කර තිබේ.

03. ගැණුම් ගිණුම රු. 3,500 ක් අඩුවෙන් එකතු කොට ඇත.

04. කෙටුම්පත් ගිණුම්වල ඇතුලත් කරන ලද අවසාන තොගය තක්සේරු කර ඇත්තේ රු. 10,000 ක් අඩුවෙනි.

05. හෙණරාජා විසින් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගන්නා ලද භාණ්ඩවල පිරිවැය රු. 11,000 කි. මෙම භාණ්ඩ සම්බන්ධ කිසිදු සටහනක් තබා නොමැත.

06. ගණුදෙනුකරුවෙකුට වර්ෂය තුළ දී විකුණන ලද රු. 4,500 ක භාණ්ඩ ආපසු එවා ඇත. මෙම ආපසු එවීම සම්බන්ධව කිසිම සටහනක් ආපසු එවීමේ ජ'නලයේ තබා නැත.

අවශ්‍ය වන්නේ,

01. වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන්,

02. ශුද්ධ ලාභය නිවැරදි කිරීම සඳහා වූ ප්‍රකාශයක්,

03. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ විසර්ජන ප්‍රකාශය,

04. 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම්

(ලකුණු 10)

(ආ) ලින්ඩා සමාගමේ එක්ලස් කිරීම හා නිමකිරීම වශයෙන් නිෂ්පාදන අංශ 2 ක් ද, නඩත්තු අංශය හා ගබඩාව වශයෙන් සේවා අංශ 02 ක් ද පවතී.

ඇස්තමේන්තුගත වාර්ෂක පොදුකාර්යය පිරිවැය

	වක්‍ර ද්‍රව්‍ය	වක්‍ර ශ්‍රමය
එකලස් කිරීම	300,000	200,000
නිමකිරීම	200,000	200,000
නඩත්තු	100,000	100,000
ගබඩා	40,000	50,000
	640,000	550,000

අනිකුත් පොදු කාර්යය,

	රු.
කම්හල් කුලී	160,000
යන්ත්‍ර ක්ෂය	300,000
විදුලිය	100,000
සේවක සුහසාධක වියදම්	200,000
	760,000

අතිකුත් තොරතුරු

	එක්ලස් කිරීම	නිම කිරීම	නඩත්තු	ගබඩා
බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	20,000	10,000	5,000	5,000
යන්ත්‍රවල වටිනාකම (රුපියල්)	800,000	400,000	200,000	100,000
විදුලි කිලෝවොට්	2,000	2,000	500	500
සේවක සංඛ්‍යාව	40	30	20	10
නඩත්තු සේවක ඉල්ලුම් ගණන	50	30		20
ගබඩා අධියාචනාපත් ගණන	300	200		

මෙම සමාගම X සහ Y වශයෙන් භාණ්ඩ වර්ග 02 ක් නිපදවයි. ඊට අදාළ සෘජු වියදම් තොරතුරු සහ ඒකකයට අදාළ අයවැයගත ශ්‍රමපැය හා යන්ත්‍ර පැය පිළිබඳ තොරතුරු පහත දක්වේ.

සෘජු පිරිවැය (ඒකක)	X	Y
සෘජු ද්‍රව්‍ය (ඒකක	රු. 400	රු. 700
සෘජු ශ්‍රමය (ඒකක)	රු. 500	රු. 800
සෘජු වෙනත් (ඒකක)	රු. 100	රු. 500

තොරතුරු	X		Y	
	අය වැයගත	සත්‍ය	අය වැයගත	සත්‍ය
ඒකකයකට අවශ්‍ය යන්ත්‍ර පැය එකලස් කිරීම් අංශය	5	4	2	2
ඒකකයකට අවශ්‍ය ශ්‍රම පැය නිමකිරීම් අංශය	10	9	4	3

වර්ෂය තුළදී ඇස්තමේන්තුගත නිෂ්පාදන ඒකක ප්‍රමාණය වන්නේ,

X ඒකක	4,000
Y ඒකක	10,000

පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලබන්නේ එකලස් කිරීමේ අංශය යන්ත්‍ර පැය පදනමක් අනුව සහ නිම කිරීමේ අංශය ශ්‍රමපැය පදනමක් අනුවයි.

අවශ්‍ය වන්නේ,

01. සුදුසු පදනම් ඔස්සේ පොදුකාර්ය පිරිවැය විභාජන පත්‍රිකාවක් පිළියෙල කරන්න.
02. සේවා පොදුකාර්ය පිරිවැය සඳහා සුදුසු පදනම් ඔස්ලේ යළි විභජනය කරන්න.
03. එකිනෙක අංශවල පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතයන් බැගින් ගණනය කරන්න.
04. X හා Y යන එකිනෙක භාණ්ඩ වර්ගයේ ඒකක පිරිවැය ගණනය කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

(03) (අ) 2015/03/31 දිනට අලංකාර සමාගමේ ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 50,00 ක් විය. මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පහත කරුණු හෙළිකරගෙන ඇත.

i. විකුණුම් ජ'නලයේ එකතුව රු. 2,000 කින් අඩු වී ඇත.

ii. ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 1,000 ක් වැඩි වී ඇත.

iii. විකුම් සමාගම සිදුකළ රු. 3,500 ක භාණ්ඩ ආපසු එවුම් සම්පූර්ණයෙන් පොත්වලින් මඟ හැරී ඇත.

iv. ණයගැති ලෙජරයේ අමල් සමාගම නමින් වූ රු. 1,500 ක් ශේෂ බොල්ණය ලෙස කපාහැර ඇතත් එය පොදු ලෙජරයට පිටපත් කර නොමැත.

v. ණයගැති ලෙජරයේ තිබූ කමල් සමාගමේ රු. 2,500 ක හර ශේෂය, ණයහිමි ලෙජරයේ එම සමාගම නමින් ඇති ගිණුමට මාරු කර ඇතත්, පොදු ලෙජරයට පිටපත් කර නොමැත.

vi. අතුල සමාගමට ණයට විකුණුම් රු. 23,000 ක් ණයගැති ලෙජරයේ වාර්තා කර තිබුනේ රු. 32,000 ක් ලෙසය.

vii. 2015/03/31 දිනට ඇති ණයගැති ශේෂය මත සිදුකළ යුතු 10% ක බොල්ණය සඳහා වෙන්කිරීම මෙතෙක් සිදුකර නොමැත.

අවශ්‍ය වන්නේ,

01. ණයගැති පාලන ගිණුම,

02. 2015/03/31 දිනට මූල්‍යතත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ණයගැති ශේෂය.

03. ඉහත තොරතුරු අනාවරණය වීමට ප්‍රථම ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව. (ලකුණු 06)

(ආ) අකලංකගේ ව්‍යාපාරයේ 2015/03/31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබාගත හැකිවිය.

	(රු. '000)
විකුණුම්	30,000
ආරම්භක තොගය	150
ගැණුම්	2,500
ආරම්භක ණයගැතියෝ	70
අවසාන ණයගැතියෝ	90
අවසාන තොගය	250

විකුණුම් වටිනාකමෙන් රු. 2,400,000 ණයට විකුණුම් විය. පහත දෑ ගණනය කරන්න.

i. තොග පිරිවැටුම් අනුපාතය.

ii. තොග නේවාසික කාලය.

iii. වෙළඳ ණය එකතු කිරීමේ කාලය.

iv. ණයගැති පිරිවැටුම් අනුපාතය. (ලකුණු 04)

(ඇ) ඩැනියෙල් විටෝරිගේ ව්‍යාපාරයේ 2015/03/31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ බැර පැත්තේ රු. 19,800 ක් අඩු වුයෙන් එහි වෙනස අවිනිශ්චිත ගිණුමක ලියා තබන බවට විටෝරිගේ පොත් තබන්නා පැවසීය. කෙසේ වුවත් විටෝරිගේ ඉල්ලීම පරිදි බණ්ඩාර දිසානායක ගිණුම් පොත් පරීක්ෂාවේදී පහත වැරදි සොයා ගන්නා ලදී.

i. නවසීලන්ත, බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම් දෙක අතර පැවති ක්‍රිකට් තරගය දවසේ දී විකුණුම් පොතේ එකතුව රු. 6,000 ක් අඩුවෙන් එකතු කර ඇත. මෙය පාලන ගිණුමට පමණක් නිවැරදිව වාර්තා කර ඇත.

ii. විජයට විකුණන ලද රු. 15,000 ක භාණ්ඩ වැරදීමකින් සරත්ගේ ගිණුමට හරකර තිබීම.

iii. ගෙවල් කුලී ගිණුම රු. 4,200 ක් අඩුවෙන් එකතු කර තිබීම.

iv. ණයහිමි වට්ටම් තීරුව රු. 18,000 ක් අඩුවෙන් එකතු කර ඇත. මෙය ණයහිමි පාලන ගිණුමේ නිවැරදිව සටහන් කර ඇත.

v. පොත් අගය රු. 21,600 කාර්යාල උපකරණ ඩේවිඩ්ට විකුණා ලද මුදල මුදල් පොතේ නිවැරදිව සටහන් කළත් වැරදීමකින් විකුණුම් ගිණුමට බැර කර ඇත.

අවශ්‍ය වන්නේ,

01. වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්.

02. අවිනිශ්චිත ගිණුම.

03. 2015/03/31 න් අවසන් වර්ෂයේ කෙටුම්පත් කළ ලාභය රු. 741,000 ක් නම් වැරදි නිවැරදි කිරීමෙන් පසු ශුද්ධ ලාභය පෙන්වන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

(04) (අ) බිනෝජ් මහතා වානේ අල්මාරි ආනයනය කර විකිණීමේ නව ව්‍යාපාරයක් අරඹා ඇත. ඔහු නිසි ආකාරයට පොත් තබාගෙන ඇත. බිනෝජ් මහතා 2014/12/31 න් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු සපයා තිබේ.

1. 2014/01/01 දිනට පැවති වත්කම් හා වගකීම් රු. ('000)

ගොඩනැගිලි	2,000
මෝටර් රථ	1,500
ලී බඩු	60
තොග	525
ණයගැතියෝ	500
ණයහිමියෝ	650
උපචිත පොදු වියදම්	30

2. 2014/01/01 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශනයට අදාළ තොරතුරු මෙසේය.

බැංකු ප්‍රකාශනයට අනුව බැංකු අයිරාව	රු. 60,500
නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්	රු. 110,500
තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්	රු. 540,000

3. වර්ෂයේ විකුණුම් රු. 8,500,000 කි.

4. සියළුම විකුණුම් හා මිලට ගැණුම් ණය පදනම මත සිදුවිය.

5. විකුණුම් මත 20% ක දළ ලාභ අනුපාතයක් ව්‍යාපාරය පවත්වා ගනී.

6. බිනෝජ් මහතා ඔහුගේ ලැබීම් සියල්ලම සිය බැංකු ගිණුමේ තැන්පත් කරන අතර ව්‍යාපාරයේ සියළු ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කරයි.

7. 2014 දෙසැම්බර් මස බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසු 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් සාරාංශගත තොරතුරු ඔහුගේ පොත්වලින් ලබාගෙන ඇත.

ගෙවූ වැටුප් හා වේතන	රු. 480,000
ගෙවූ පොදු වියදම්	රු. 350,000
දුන් වට්ටම්	රු. 100,000
ලද වට්ටම්	රු. 50,000
ගණුදෙනුකරුවන්ගෙන් ලැබීම්	රු. 8,300,000
සැපයුම්කරුවන්ට ගෙවීම්	රු. 6,500,000
පුද්ගලික ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද චෙක්පත්	රු. 150,000

8. බැංකු ප්‍රකාශනය පරීක්ෂා කිරීමේදී රු. 10,000 ක බැංකු ගාස්තු සොයා ගන්නා ලදී.
9. 2014 වර්ෂය තුළ බිනෝජ් මහතා ව්‍යාපාර කටයුතු සඳහා රු. 45,000 ක් ඔහුගේ පෞද්ගලික මුදලින් වියදම්කර ඇත.
10. 2014/12/31 දිනට පොදු වියදම් සඳහා ඉදිරියට ගෙවීම් රු. 8,000 ක් වූ අතර අවසාන බඩු තොගට රු. 490,000 කි.
11. ගොඩනැගිලි, මෝටර්රථ හා ලී බඩු සෑම වර්ෂයකටම ජනවාරි 01 දිනට වූ ශේෂය මත 10% ක් සේ කපාහැරීම ඔහුගේ ක්ෂය ප්‍රතිපත්තියයි.

අවශ්‍ය වන්නේ,

01. 2014/01/01 දිනට ප්‍රාග්ධනය
02. 2014/12/31 න් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශය
03. 2014/12/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (ලකුණු 09)

(ආ) ප්‍රසන්න ව්‍යාපාරයේ යන්ත්‍ර සම්බන්ධයෙන් 2014/01/01 දිනදී ලබාගත් තොරතුරු පහත දැක්වේ.

යන්ත්‍ර වර්ගය	මිලදී ගත් දිනය	පිරිවැය	සුන්බුන් අගය	ඵලදායී ජීව කාලය (වසර)
මිශ්‍රණ	2012/01/01	640,000	40,000	10
සැකසුම්	2013/07/01	350,000	50,000	6
නිමවුම්	2013/10/01	800,000	100,000	7

2014 වර්ෂයේ පහත කරුණු සිදුවී තිබේ.

1. 2014/01/01 දිනදී මිශ්‍රණ යන්ත්‍රයේ තාක්ෂණික වෙනස්කම් සිදුවී තිබූ නිසා වත්කමේ ඉදිරි ඵලදායී ජීවිත කාලය එදින සිට ඉදිරි වර්ෂ 05 කට සීමාවන බව තීරණය කළහ.
2. 2014/12/31 දිනදී සැකසුම් යන්ත්‍රය රු. 245,000 කට විකුණන ලදී.
3. නිමවුම් යන්ත්‍රයට 2014/01/01 දිනදී රු. 200,000 ක ප්‍රාග්ධන වියදමක් දරන ලද අතර මේ නිසා එහි සුංබුං අගය රු. 120,000 දක්වා වැඩිවන බවත්, එදින සිට ඵලදායී ජීවිතකාලය වර්ෂ 08 ක් වන ලෙසත් ඇස්තමේන්තු කළහ.
4. 2014/07/01 දින නව යන්ත්‍රයක් රු. 200,000 කට ඇහුරුම් කටයුතු වලට මිලදී ගන්නා ලදී. එහි සුංබුං අගය රු. 20,000 වන අතර ඵලදායී ජීවිත කාලය වර්ෂ 06 කි.

   සරල මාර්ග ක්‍රමයට යන්ත්‍ර ක්ෂය කෙරේ.

අවශ්‍ය වන්නේ,

01. මිශ්‍රණ යන්ත්‍රයේ 2014 වර්ෂයේ ක්ෂය ගණනය කරන්න.
02. සැකසුම් යන්ත්‍රය විකිණීමේ ලාභ හෝ පාඩු ඉවත්කිරීමේ ගිණුමක පෙන්වන්න.
03. නිමවුම් යන්ත්‍රයේ 2014 වර්ෂයේ ක්ෂය ගණනය කරන්න.
04. 2014 වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ගන්නා මුළු ක්ෂය ප්‍රමාණය පෙන්වන්න.
05. 2014 වර්ෂයට,
    (අ) යන්ත්‍ර ගිණුම
    (ආ) යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම පෙන්වන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 15)

(05) (අ) 2015 මාර්තු 31 දිනෙන් අවසන් සතිය සඳහා සේවක වේතනවලට අදාළව සීමිත හෙළදිව සමාගමේ තොරතුරු ඔබට ලබා දී ඇත.

ජනිත් සඳුදා සිට බ්‍රහස්පතින්දා දක්වා දවසට පැය 8 බැගින් ද, සිකුරාදා පැය 12 ක් ද වැඩ කර ඇත.

ලලිත් සඳුදා සිට සිකුරාදා දක්වා දවසට පැය 8 බැගින් එක දිගට වැඩකර ඇති අතර, මොහු සෙනසුරාදා පැය 5 ක් වැඩ කර ඇත.

අමිල සඳුදා සිට සිකුරාදා දක්වා පැය 8 බැගින් වැඩ කර ඇති අතර ඉරිදා දින පැය 5 ක් වැඩ කර ඇත.

සියළුම සේවකයන්ට රු. 1,000 බැගින් සෑම මසකම අමතර දීමනාවක් ලැබේ.

වැටුප් අනුපාතිකයන් මෙසේය.

සතියට පළමු පැය 40	පැයකට රු. 40
අතිකාල පැය	ඉරිදා අනුමත අනුපාතය මෙන් දෙගුණයකි.
වැටුප් අනුපාතය	අනෙකුත් දිනවල අනුමත අනුපාතය මෙන් එකහමාරකි.

සෑම මසකම වැටුප ඊළඟ මාසයේ දී ගෙවයි.

සේවක අර්ථසාධක අරමුදල් දායකයන් සේව්‍යා 15% ක් ද, සේවකයා 10% ක් ද වේ.

අමිල විසින් රු. 960 ක වැටුප් අත්තිකාරම් ලබාගෙන ඇත. ආයතනයේ ප්‍රතිපත්තිය වන්නේ අර්ථසාධක අරමුදල් ගණනය කිරීමේදී අතිකාල දීමනා සැලකිල්ලට නොගැනීමයි. (දිනකට සාමාන්‍යයෙන් පැය 08 ක් වැඩ කෙරේ.)

ලලිත්ගේ නිවාස ණය වාරිකය සතිපතා ඔහුගේ වැටුපෙන් අඩුකර මහජන බැංකුවට ගෙවන ලෙස සමාගම පවසා ඇත. වාරිකය රු. 780 කි.

අවශ්‍ය වන්නේ,

01. හෙළදිව සමාගමේ 2015/03/31 න් අවසන් සතියට වැටුප් ලේඛණය පිළියෙල කරන්න.
02. වැටුප් ලේඛණයේ ඇතුලත් තොරතුරු පොදු ලෙජරයට පිටපත් කරන්න.
03. වැටුප් ලේඛණයක් පිළියෙල කිරීමේදී යොදාගන්නා මූලාශ්‍ර 04 ක් නම් කරන්න.

(ලකුණු 08)

(ආ) ඩිලාන් ව්‍යාපාරයේ 2015/03/31 දින උපුටාගත් මූල්‍යතත්ව ප්‍රකාශ අයිතම පහත දැක්වේ.

මූල්‍ය තත්ව ප්‍රකාශය (රු. ,000)

දේපල පිරියත හා උපකරණ		12,000
ජංගම වත්කම්		
තොගය	3,000	
ණයගැතියෝ	2,000	
මුදල් හා බැංකු	300	8,000
		20,000
ප්‍රාග්ධනය		15,000
12% බැංකුණය	4,000	
ණයහිමියෝ	1,000	5,000
		20,000

පහත ගණුදෙනු 2015 අප්‍රේල් මාසයේ සිදුවී ඇත.

1. රු. 500,000 විකුණුම් මිල භාණ්ඩ ණයට විකුණන ලදී. එහි දළලාභ අනුපාතය විකුණුම් මිලෙන් 40% කි.
2. රු. 800,000 ක විකුණුම් අත්පිට මුදලට සිදුකරන ලදී. එහි දළ ලාභ අනුපාතය විකුණුම් මත 30% කි.
3. ණයගැතියන්ගේ ණයවලින් රු. 400,000 ණය පියවීමට ප්‍රමාණවත් මුදලක් 10% වට්ටම් යටතේ ලැබුණි.
4. ණයහිමියන්ට රු. 300,000 ණය පියවීමට ප්‍රමාණවත් මුදලක් 10% ක වට්ටම් යටතේ ගෙවීය.
5. බැංකු ණය ලෙසට රු. 50,000 ක් ද, පොලී ලෙසට රු. 10,000 ක් ද සහිතව බැංකුවට රු. 60,000 ක් ගෙව්වා.
6. ණයට විකුණුම් කළ භාණ්ඩවලින් රු. 100,000 ක් විකුණුම් මිල වු භාණ්ඩ ණයගැතියන් විසින් ආපසු එවන ලදී.
7. මාසයකට රු. 10,000 බැගින් ඔක්තෝබර් සිට ඇරඹෙන ඉදිරි මාස 06 ක කුලී මුදලින් ගෙව්වා.
8. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 30,000 ක මුදල් ගෙන ගියා.
9. අයිතිකරු පෞද්ගලික මුදලකින් ණයහිමියන්ට රු. 50,000 ක් ගෙව්වා.
10. ප්‍රචාරණ වියදම් රු. 40,000 ක් වුවත් එය මෙතෙක් ගෙවා නැත.

අවශ්‍ය වන්නේ,

01. ඉහත ගණුදෙනු හා ආරම්භක ශේෂය හිමිකම් + වගකීම් = වත්කම් යන ගිණුම්කරණ සමීකරණය ගලපන්න.

02. ශුද්ධ වත්කම් ප්‍රවේශය ඔස්සේ ලාභය ගණනය කරන්න. (ලකුණු 07)

(මුළු ලකුණු 15)

(06) (අ) සමගි ක්‍රීඩා සංගමයේ භාණ්ඩාගාරික විසින් 2014 දෙසැම්බර් 31 දිනෙන් සහ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

ආදායම් ප්‍රකාශය

	2014 (රු. '000)	2013 (රු. '000)
ආදායම්		
සාමාජික මුදල්	13,000	12,500
පරිත්‍යාග මුදලින්	13,000	2,000
ආයෝජන ආදායම්	2,000	
	28,000	14,500
අඩුකළා වියදම්		
පුවත්පත්	1,500	1,000
සේවක වේතන	5,000	4,500
ලිපිද්‍රව්‍ය	1,000	1,500
වාර්ෂික ක්‍රීඩා තරග වියදම්	3,000	5,000
ක්‍රීඩා උපකරණ ක්ෂය	3,000	2,000
අතිරික්තය	14,500	500

දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	2014 (රු. 000)	2013 (රු. 000)
ජංගම නොවන වත්කම්		
ක්‍රීඩා උපකරණ	27,000	18,000
ආයෝජන	11,000	
ජංගම වත්කම්		
ලිපිද්‍රව්‍ය තොගය	3,000	500
ලැබිය යුතු සාමාජික මුදල්	7,000	2,500
ලැබිය යුතු ආයෝජන ආදායම්	2,000	
බැංකු ශේෂය		9,000
	50,000	30,000
ජනවාරි 01 දිනට සමුච්චිත අරමුදල	25,000	24,500
එකතු කළා		
වර්ෂයේ අතිරික්තය	14,500	500
උපචිත ක්‍රීඩා තරග වියදම්		2,000
ඉදිරියට ලද සාමාජික මුදල්	500	3,000
බැංකු අයිරාව	10,000	
	50,000	30,000

අවශ්‍ය වන්නේ,

01. 2014 වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම.

02. 2014 වර්ෂයේදී අතිරික්තය රු. 14,500 ක්වා වැඩි වී ඇතත් බැංකු ශේෂය රු. 10,000 ක අයිරාවක් බවට පත්වීමට හේතු විය හැකි ප්‍රධාන හේතු 02 ක් සඳහන් කරන්න.

(ලකුණු 08)

(ආ) ලක්ෂාන් සමාගම යන්ත්‍රයක් මිලදීගෙන භාණ්ඩයක් නිපදවා විකිණීම කරයි. යන්ත්‍රයේ ඵලදායී ජීවිත කාලය වර්ෂ 04 කි. යන්ත්‍රයේ මූලික පිරිවැය රු. 300,000 කි. නිපදවන ඒකකයක විකුණුම් මිල රු. 100 වන අතර, ඒකකයක විචල්‍ය පිරිවැය රු. 40 කි. වර්ෂ 04 අවසානයේ දී යන්ත්‍රයේ සුංබුං අගය රු. 50,000 කි. දෙවන වර්ෂයේ දී යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට රු. 40,000 ක් වැය වේ. මුදල් ලැබීම් හා ගෙවීම් අදාළ වර්ෂය තුළදීම සිදුවේ. වර්ෂ 04 ක නිෂ්පාදන ඒකක පහත දක්වේ.

වර්ෂය	නිෂ්පාදන ඒකක
01	1,000
02	3,000
03	4,000
04	5,000

වර්ෂයකට 10% යටතේ වර්ෂ 04 ක් සඳහා වට්ටම් සාධක

වර්ෂය	0	1	2	3	4
වට්ටම් සාධක	1	.91	.81	.75	.68

අවශ්‍ය වන්නේ,

01. ව්‍යාපෘති වාර්තාවක් සකසන්න.

02. 10% වට්ටම් සාධකය යටතේ ශුද්ධ වර්තමාන අගය තීරණය කරන්න.

03. ව්‍යාපෘති පිළිගනී ද නැද්ද යන්න දක්වන්න. (ලකුණු 07)

(මුළු ලකුණු 15)

(07) (අ) බිස්කට් වර්ගයක් නිපදවා අලෙවිකරණ ලකීලෑන්ඩ් සමාගම විකුණුම් සේවකයන්ට විකුණුම් ඒකකයකට රු. 2.25 බැගින් කොමිස් මුදලක් ගෙවනු ලබන්නේ ඔවුන් දිරිමත් කිරීම සඳහාය. මෙම ගෙවීම් ඔවුන්ගේ මාසික ස්ථිර වැටුපට අමතරව ගෙවනු ලබයි. එම විශේෂිත බිස්කට් වර්ගයට අදාළ තොරතුරු පහත දැක්වේ.

ඒකකයක විකුණුම් මිල	රු.	15.00
කොමිස් හැර ඒකක විචල්‍ය වියදම්	රු.	6.75
වාර්ෂික ස්ථාවර පිරිවැය		
ප්‍රචාරණය	රු.	15,000
වේතන	රු.	50,000
බදු කුලී	රු.	10,000

ඉහත තොරතුරු ආධාර කරගෙන පහත දෑ ගණනය කරන්න.

01. සමච්ඡේදන ලක්‍ෂය ඒකකවලින් හා රුපියල් වලින් ගණනය කරන්න.

02. වාර්ෂික ඒකක 6,000 අලෙවි කළහොත් ලාභය හෝ අලාභය දැක්වෙන ප්‍රකාශයක්.

03. ආයතනයේ විකුණුම් කළමණාකරුට එක් ඒකකයකට රුපියලක කොමිස් මුදලක් ගෙවීම තීරණය කළහොත් නව සමච්ඡේදන ලක්‍ෂය ඒකක හා රුපියල් වලින් ගණනය කරන්න.

04. ආයතනයේ කළමණාකරුට සමච්ඡේද ලක්‍ෂ විකුණුම් ප්‍රමාණය ඉක්මවන විකුණුම් සඳහා රුපියලක කොමිස් මුදලක් ගෙව්වහොත් ඒකක 17,500 ක් විකුණන විට ලාභය හෝ අලාභය.

05. ආයතනය විකුණුම් සේවකයන්ට හා කළමණාකරුට ගෙවන කොමිස් සියල්ල අහිමි කර ඒ වෙනුවට වාර්ෂික වේතනය රු. 5,750 කින් වැඩි කළහොත් නව සමච්ඡේදනයට අදාළ විකුණුම් අගය හා ඒකක ගණන කොපමණ ද?

(ලකුණු 10)

(ආ) 2015/03/31 න් අවසන් වර්ෂය සඳහා විහංගා මේස නිෂ්පාදන ආයතනයේ තොරතුරු පහත දක්වා ඇත.

• නිෂ්පාදන මේස	2,000
• විකුණුම් මේස	1,800
• පාවිච්චි කළ මුළු දැව ප්‍රමාණය වර්ග මීටර්	12,000
• එක් මේසයක් සඳහා වඩුකාර්මික ශ්‍රම පිරිවැය	7,220
• වාර්ෂික පොදු කාර්ය පිරිවැය	
නිෂ්පාදන	800,000
නිෂ්පාදන නොවන	600,000

- ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය තොග නිකුත් කිරීම සඳහා යොදා ගනු ලබයි.

- ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය තොග නිකුත් කිරීම සඳහා යොදා ගනු ලබයි.
- වර්ෂය තුළදී වර්ගමීටරය රු. 1,000 බැගින් දැව වර්ග මීටර් 12,300 ක් මිලට ගෙන ඇත.
- 2014/04/01 දිනට තොගය,

  එකක් රු. 800 බැගින් මිලට ගත් දැව වර්ගමීටර් 200.

  ඒකකයක නිෂ්පාදන පිරිවැය රු. 10,400 ක් වූ මේස 160.
- 2015/03/31 දින ගබඩාවේ තිබූ දැව වර්ගමීටර 130 ක් හානිවී ඇති අතර එහි පිරිවැය කාලච්ඡේද පිරිවැයක් (Periodic Cost) ලෙස සැලකිය යුතුයි.
- මේසයක විකුණුම් මිල රු. 20,000 කි.

අවශ්‍ය වන්නේ,

01. වර්ෂයේ මුළු නිෂ්පාදන පිරිවැය (නිෂ්පාදන ගිණුම අවශ්‍ය නොවේ.)

02. වර්ෂයේ විකුණුම් පිරිවැය.

03. 2015/03/31 න් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශය. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ගිණුම්කරණය

13 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය

I කොටස

1 - (4) 2 - (2) 3 - (5) 4 - (2) 5 - (3) 6 - (5) 7 - (4) 8 - (3) 9 - (2) 10 - (3)
11 - (1) 12 - (3) 13 - (4) 14 - (3) 15 - (4) 16 - (2) 17 - (5) 18 - (3) 19 - (5) 20 - (2)
21 - (4) 22 - (5) 23 - (3) 24 - (4) 25 - (4) 26 - (3) 27 - (0) 28 - (1) 29 - (3) 30 - (5)

(31) A වගකීම්
B වියදම්
C වත්කම්
D හිමිකම් (එක බැගින් ලකුණු 04)

(32)

කළමනාකරණ	මූල්‍ය
1. අනාගත	අතීත
2. නිශ්චිත නොවේ	වර්ෂයකට වරක්
3. අභ්‍යන්තර	බාහිර
4. ඍජුව අදාළ නොවේ	බහුලව භාවිත වේ.

(ලකුණු 01 බැගින් ලකුණු 04)

(33)

සාමාන්‍ය කොටස්	වරණීය කොටස්
1. නිශ්චිත ලාභාංශයක් හිමි නොවේ.	1. නිශ්චිත ලාභාංශයක් හිමිවේ.
2. ලාභ තිබුනොත් ලාභාංශය ලැබේ.	2. ලාභ ඇතත් නැතත් ලාභාංශ ලැබේ.

(ලකුණු 01 බැගින් ලකුණු 04)

(34) රු. 480,000 (ලකුණු 04)

(35) රු. 40,000 (ලකුණු 04)

(36) A අඩුවේ. B වැඩිවේ.
C වැඩිවේ. D අඩුවේ. (ලකුණු 04)

(37) කිසියම් ගිණුම් කාලච්ඡේදයක ආර්ථික ප්‍රතිලාභ ඉහළ යාමට බලපාන අයිතිකරුවන් විසින් කරන අරමුදල් සැපයීමක් නොවන කිසියම් ගලාඒමත්, වත්කම්වල ඉහළ යාමත්, වගකීම් පහළ යාමත් නිසා ස්කන්ධයේ ඇතිවන ඉහළ යාමත්. (ලකුණු 04)

(38) යන්ත්‍ර ගිණුම හර 1,866,500
කල්බදු ණයහිමි 1,866,500
(ලකුණු 04)

(39) A අසත්‍ය B සත්‍ය
C අසත්‍ය D අසත්‍ය (ලකුණු 04)

(40) රු. 210,000 (ලකුණු 04)

(41) A පොරොත්තු කාලය
B යළි ඇණවුම් ප්‍රමාණය (ලකුණු 02 බැගින් ලකුණු 04)

The National e-learning Portal for The General Education

(42) A මුළු දායකත්වය
B මුළු ස්ථාවර පිරිවැය
C ආරක්ෂිත අන්තය ඒකක
D ආරක්ෂිත අන්තය රුපියල් (ලකුණු 01 බැගින් ලකුණු 04)

(43) රු. 2,320,000 (ලකුණු 04)

(44) 1. සම්පූර්ණ මුදල් ප්‍රමාණයට ඇගයීම.
2. ව්‍යාපෘතිය තෝරාගැනීම හෝ නොගැනීම පිළිබඳ පැහැදිලි තීරණයක තිබීම. (ලකුණු 04)

(45) (අ) B ව්‍යාපෘති
(ආ) A හා C ව්‍යාපෘති
(ලකුණු 02 බැගින් ලකුණු 04)

(46) රු. 80,000 (ලකුණු 04)

(47) රු. 460,000 (ලකුණු 04)

(48)

ප්‍රාග්ධන දායකත්වය	පොළී	
ශ්‍රම දායකත්වය	වේතන	
නිර්මාණාත්මක දායකත්වය	ලාභ කොටස්	(අයිතම 03 ක් නිවැරදි නම් ලකුණු 04)

(49) රු. 1,439,200 (ලකුණු 04)

(50) නිමවුම් 1 රු. 150
නිමවුම් 2 රු. 45 (ලකුණු 02 බැගින් ලකුණු 04)

The National e-learning Portal for The General Education